**අයන්න කියන්න ...**

**අයන්න කියන්න ලොවටම** ඇහෙන්න
එන්න මගේ මල්ලී
දුවන්න පනින්න නටන්න ගයන්න
එන්න මගේ නංගී //

පාසල නම් රං දෙව්ලොලේ
දෙවියන් වන් ගුරු කැලගේ
සිත දිනමින් පා සෙවනේ
ශිල්ප ලබා මතු දවසේ
ලෝකය දකින්න එහි සැරි සරන්න
එන්න මගේ මල්ලී - එන්න මගේ නංගී

අයන්න කියන්න ...

කාසි පනම් හිටි හැටියේ
සතුරෝ ගෙනයති රහසේ
පොතින් පතින් ලද දැනුමේ
ධනය සදාකල් සුරැකේ
ඥාණය වඩන්න කාලය ගෙවන්න
එන්න මගේ මල්ලී - එන්න මගේ නංගී

අයන්න කියන්න ...

*නන්දා මාලනී*